**ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ ("මධ්‍යස්ථානය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මධ්‍යස්ථානය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

.

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2014 මැයි 30 දිනැති අංක 14/2014 හා 2018 ජුලි 31 දිනැති අංක 18/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා ආයතන සංග්‍රහයේ XLVIII 13.1 වගන්තිය. | අධ්‍යකෂ ජනරාල් හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ හා සංවර්ධන) ඇතුළුව නිළධාරීන් 6 දෙනෙකු සම්බන්ධයෙන් විෂමාචාරයක් සිදුකළ බවට සැකයක් හෝ එවැනි නිශ්චිත තොරතුරක් හඳුනා නොගෙන විමර්ශන කමිටු පත්කර විමර්ශන කටයුතු සිදුකර තිබූ අතර විමර්ශන කමිටු සඳහා චක්‍රලේඛ අභිබවා එකතුව රු. 4,035,135ක දීමනා ද ප්‍රවාහන පහසුකම් සැපයීමට රු.1,170,209 ක ගෙවීම්ද සිදුකර තිබුණි. | විමර්ශන කමිටු සාමාජිකයින් සඳහා ගෙවීම් සිදුකිරීමට අධ්‍යක්ෂක මණ්ඩල තීරණ අනුව MSVRI/ADM/30/01/08, 2022.01.17 දිනැති ලිපිය මගින් අධ්‍යාපන අමාත්‍යංශය විසින් අනුමැතිය ලබාදී ඇත. | කරුණු නිශ්චිතව හඳුනාගෙන හෝ සාධාරණ සැකයක් මත පමණක් විමර්ෂණ කමිටුවක් පත් කල යුතු අතර චක්‍රලේඛ හා ආයතන සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව ගෙවීම් සිදුකල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XLVIII 31.1වගන්තිය | විෂමාචාර ක්‍රියාවක් සිදුකල බවට හඳුනා නොගෙන සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ හා සංවර්ධන) ලෙස කටයුතු කරන ලද | නිෂ්චිතව හා පැහැදිලි කරුණු මත පදනම්ව පමණක් සේවක විනය ක්‍රියාමාර්ග ගත යුතු අතර |

| | | | | |
|---|---|---|---|---|
| | | (පර්යේෂණ හා සංවර්ධන) 2022 ජූනි 07 දින සිට අනිවාර්ය නිවාඩු ගන්වා තිබුණි. ඊට විරුද්ධව නිකුත් කළ අධිකරණ නියෝගය මඟින් නැවත සේවයේ පිහිටුවීම හේතුවෙන් සේවයක් නොලබා ගෙවන ලද වැටුප් රු.1,008,160 සහ නීතිඥ ගාස්තු රු.75,000ක් නිෂ්කාර්ය වියදමක්ව තිබුණි. | නිලධාරියා 2022.06.07 දින සිට මාස හයක කාලයකින් අනිවාර්ය විශ්‍රාම ගන්වා ඇත. ඒ මහතා විසින් නෛතික ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් පසු 2022.11.21 දින සිට නැවත සේවයේ පිහිටවා ඇත. 2022.12.31 දින දක්වා අඛණ්ඩව සේවයේ නියුතුව සිටියා සේ සළකා ඔහුට හිමි මූලික වැටුප සහ තනතුරට අදාළ අනෙකුත් සියළු දීමනා අධිකරණ නියෝගයට අනුකූලව මේ වන විට ගෙවා ඇත. | මානව සම්පත් කළමනාකරණය නිසි පරිදි සිදුකල යුතුය. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මෙහෙයුම් මාර්ගෝපදේශ අත්පොතෙහි 6.6 ඡේදය | සමාලෝචිත වර්ෂයට අදාල කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් ගිණුම් වර්ෂය අවසන් වී දින හැටක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, විගණිත දිනය වූ 2023 මැයි 10 දින වන විටත් එකී වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | ආයතනයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමෙන් අනතුරුව මේ වන විට 2022 වාර්ෂික වාර්තාව පිළියෙල කෙරෙමින් පවතී. මේ සඳහා ආයතනය තුළ පැවත එන විධායක ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීමට ඇති වාර්තමාන බාධක විශේෂයෙන් බලපා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව නියමිත දිනයේදී අදාල වාර්තා විගණකාධිපතිවර යා වෙත ඉදිරිපත් කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.18,644,297 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 18,989,410 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.345,113 පිරිහිමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අනෙකුත් ආදායම් රු. 13,752,051 කින් වැඩිවුවද, පරිපාලන වියදම් රු.29,529,399 කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාග්ධන වියදම් සඳහා ලබාදෙනු ලබන ප්‍රාග්ධන ප්‍රදානයන් අදාල වර්ෂය තුලදීම වියදම් කලයුතු අතර ඉන් යම් මුදලක් ඉතිරි වුවහොත් එම අරමුදල් වලින් සිදුකිරීමට අපේක්ෂිත වියදම් හෙළිදරව් කලයුතු නමුත් මෙම මධ්‍යස්ථානයට සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ වලදී ලබා දී තිබූ ප්‍රාග්ධන ප්‍රදාන වලින් රු.8,551,327 ක මුදලක් ඉතිරිව තිබුණද එම මුදලින් අපේක්ෂිත වියදම් හෙළිදරව් කර නොතිබුණි. | යම් කාලවලදි රජයෙන් ලැබෙන ප්‍රාග්ධන මුදල් ප්‍රමාද වී ලැබෙන නිසා මෙම ඉතිරිව ඇති ප්‍රාග්ධන මුදල් පර්යේෂණ කටයුතු සඳහා යොදා ගැනීමට සිදුවේ. | ප්‍රාග්ධන ප්‍රදාන වැයකරන ආකාරය හෙලිදරව් කළ යුතුය. |
| (ආ) | 2001 ජූලි මාසයේදී ආසියානු සංවර්ධන බැංකු ණය ව්‍යාපෘතිය යටතේ සපයාගෙන තිබූ ධාරිතාවය 2,500 KG ක් වූ රු. 26,488,211ක වටිනාකමැති CNC Milling යන්ත්‍රය සඳහා 2014 හා 2015 වර්ෂවල රු. 10,441,338ක වියදම් දරා උපාංග යොදා අලුත්වැඩියා සිදු කිරීමෙන් අනතුරුව ඊට වඩා අඩු ධාරිතාවයකින් යුතු (2,200 KG) තවත් CNC Milling යන්ත්‍රයක් 2017 වර්ෂයේදී රු. 26,150,497 සපයාගෙන තිබුණි. පළමු යන්ත්‍රයෙන් ඉටු කිරීමට ප්‍රමාණවත් කාර්යයභාරයන් පවා නොතිබියදී තවත් යන්ත්‍රයක් මිලදී ගැනීමට වැයකල මුදල නිෂ්කාර්ය වී තිබුණි. | 2017 වර්ෂයේදී නව නිපැයුම්කරුවන්ගේ කොමිෂම හා එක්ව ඒ වන විට අත්‍යාවශ්‍ය වී තිබූ නව නිපැයුම්කරුවන් සඳහා තාක්ෂණික උදව් ලබාදීම පිණිස තාක්ෂණික ඉන්කියුබේටර් අංශය පිහිටු වන ලදී. එහිදි, එම සේවාවන් ලබාදීම සඳහා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂම විසින් CNC Milling යන්ත්‍රයක් ඉන්කියුබේටරය වෙත ලබාදෙන ලදී. මෙහිදි ඉන්කියුබේටර් අංශය සතුව තිබූ වසර 20 පමණ පැරණි CNC Milling යන්ත්‍රය වරින් වර දෝෂවලට ලක්වීම ද සැලකිල්ලට ගැණුනි. | ආයතනය සතු යන්ත්‍ර කාර්යක්ෂමව හා ඵලදායිව අරමුණ කරා යොදා ගත යුතුය. |
| (ඇ) | මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මානව සම්පත් කළමනාකරණ නිලධාරිනිය 2022 පෙබරවාරි 07 දින සිට කාර්මික උද්‍යානය වෙත කිසිදු රාජකාරි පැවරීමකින් තොරව මාරුකර තිබූ අතර, මූලික විමර්ශන | ආයතනයේ සමස්ථ කළමනාකාරීත්වය සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කෙරෙමින් පවතින බැවින් එම විමර්ශන කටයුතු විනිවිද භාවයකින් | ආයතනයට උපරිම ප්‍රතිඵල ලැබෙන පරිදි මානව සම්පත් කළමනාකරණය |

| | | |
|---|---|---|
| වාර්තාවක් 2022 ඔක්තෝබර් 17 දින ඉදිරිපත් කර තිබුනද චෝදනාපත්‍රයක් ලබානොදී විගණිත දින වූ 2023 අප්‍රේල් 06 දින දක්වා වැටුප් ලෙස ගෙවා තිබූ රු.3,047,473 ක මුදල නිෂ්කාර්ය ශ්‍රම පිරිවැයක් වී තිබුණි. | සිදුකිරීමේ අරමුණින් ආයතනයේ අධ්‍යක්ෂ (මානව සම්පත්) ලෙස කටයුතු කල බී.ඒ.එම්. මුණසිංහ මහත්මිය 2022.02.07 දින සිට තාක්ෂණික උද්‍යානය වෙත අනුයුක්ත කර ඇත. විමර්ශන කමිටුව විසින් එම නිලධාරිනියට චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර තිබූ අතර එය ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් මත 2023.04.27 වන දින අධ්‍යක්ෂ (මානව සම්පත්), එම මහත්මිය වෙත බාරදෙන ලදි. | කල යුතුය. |
| (ඇ) ව්‍යාපෘති වල ආර්ථිකභාවය, සේවකයන් ලබාගත හැකි ආකාරය, අරමුදල් ලබාගත හැකි ආකාරය වැනි කරුණු පිළිබඳව ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථම විධිමත්ව පූර්ව ශක්‍යතා අධ්‍යයන සිදු නොකර ව්‍යාපෘති ආරම්භ කිරීම නිසා, පහත ව්‍යාපෘති අතරමග නතර කිරීම සිදු වී තිබුණි. | | |
| i. සෙවිලි උළු වියලන යන්ත්‍රයක් සංවර්ධනය කිරීම, වෙරළ ආශ්‍රිත අපද්‍රව්‍ය ඉවත් කිරීමේ යන්ත්‍රයක් සැලසුම් කිරීම හා සංවර්ධනය කිරීම සහ ඇලමාර්ගවල එකතු වන අපද්‍රව්‍ය ඉවත් කරන පාරුවක් සැලසුම් කර සංවර්ධනය කිරීම යන ව්‍යාපෘති 03 සඳහා පසුව අරමුදල් ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් නතර කර තිබුණි. එසේ නතර කරන අවස්ථාව වන විට ව්‍යාපෘති 03 සඳහා වියදම් ඇස්තමේන්තුව රු.11,500,000ක් වුවද, තත්‍ය වියදම රු.5,674,005 ක් වුයෙන් පසුව ඉතිරි අරමුදල් ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් අතරමග නවතා දමා තිබුණි. | ප්‍රධාන අරමුණ වූයේ සාම්ප්‍රදායික උළු නිෂ්පාදන ක්‍රියාවලියේ ඇති ප්‍රධාන අවාසි වන සියයට 20ක පමණ උළු පළුදු වී නාස්තිවීම, වැසි කාලයේදී වියලීමේ කාලය වැඩිවීම හා උළු වියලනය තුළ ඇතිරීමේදී ඇති සේවකයින්ගේ අනාරක්ෂිත භාවය අවම කිරීමය. මේ සඳහා නර්ඩ් ආයතනය කළ නිර්මාණය උළු නිෂ්පාදනකයින් පිළිගනු ලැබූ නමුත් වියලනය තුළ ගමන්කරවීම සහ ඉවත් කරවීම සඳහා නිර්මාණය කරණ ලද යාන්ත්‍රික ක්‍රියාවලියේ වැඩි දියුණු කිරීම අවශ්‍ය බවත් මේ සඳහා අමතරව මිලියන 2.5ක මුදලක් වෙළඳ හා කර්මාන්ත අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටියද මුදල් ලබාදීමට නොහැකි නිසා මෙම ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යෑමට නොහැකි විය.<br><br>* වෙරළ ආශ්‍රිත අපද්‍රව්‍ය ඉවත් කිරිම් යන්ත්‍රය හා ඇල මාර්ග වල එකතුවන අපද්‍රව්‍ය ඉවත් කරන | නිසි පරිදි ශක්‍යතා අධ්‍යනයක් සිදුකර ව්‍යාපෘති තෝරා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | පාරුවක් සැළසුම් කර සංවර්ධනය කිරිම හා ව්‍යාපෘති සමුද්‍රීය පරිසර අධිකාරිය (MEPA) ඒකාබද්ධව ඔවුන්ගේ අරමුදල් යොදවා ක්‍රියාත්මක කිරිමට සැළසුම් කලද වියදම් දැරීමට ප්‍රතිපාදන නොමැති බැවින් තාවකාලිකව අත්හිටුවීමට තීරණය කර ඇත. | |
| ii. | අංක AE&MD/RES/10/2021 දරන එළවළු සහ පළතුරු ප්‍රවාහනය සඳහා දුම්රිය මැදිරියේ සැලසුම් වෙනස් කිරීම සහ කාර්ය සාධනය ඇගයීමේ ව්‍යාපෘතිය, අංක ENED/RES/39/2022 දරන දැදුරු ඔයේ වාන් දොරටු සංවර්ධනය සඳහා වන ව්‍යාපෘතිය සහ අංක N/MED/CRES/NHSL/30/2018 දරන සායනික සාම්පල ප්‍රවාහනය සඳහා වායුමය නල පද්ධති නිර්මාණය යන ව්‍යාපෘති 03 සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.2,954,000 න් රු.1,734,795 ක වියදමක් දැරීමෙන් පසු අතර මග නතර කර තිබුණි. | AE & MD/RES/10/ 2021 දරන ව්‍යාපෘතියේ රාජ්‍ය ආයතන දෙකක් වන ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (NERDC) සහ ජාතික පසු අස්වනු කළමණාකරන ආයතනය (NIPHM) අතර අවබෝධතා ගිවිසුමකට අනුව පළමු අදියරේ කටයුතු සිදු කළ අතර අදාල නිර්මාණ කටයුතු සිදු කර අදාල වාර්තාව NIPHM වෙත භාරදී ඇත.<br>* ENED/RES/39/2022 යටතේ ක්රියාත්මක කළ දැදුරුඔය වාන් දොරටු සංවර්ධනය සඳහා ව්‍යාපෘතියේ මූලික අධ්‍යනය කටයුතු සිදු කල අතර අදාල කටයුතු සඳහා අවබෝධතා ගිවිසුමක් සකස් කර රජයේ කර්මාන්ත ශාලාව වෙත යවන ලද අතර ඒ පිළිබඳව යහපත් ප්‍රතිචාරයක් නොලැබීම නිසා ව්‍යාපෘතිය අතරමඟ නතර කිරිමට තීරණය කරන ලදි.<br>* N/ MED/ CRES/ NHSL/ 30/ 2018 ව්‍යාපෘතියේ මූලික පර්යේෂණ කටයුතු අවසන් කරන ලද අතර මෙම ව්‍යාපෘතියට සම්බන්ධ මූලාකෘතියක් නිර්මාණය කර ක්‍රියාකාරීත්වය සනාථ කොට පර්යේෂණය සිදු කරන ලදී. | නිසි පරිදි ශක්‍යතා අධ්‍යනයක් සිදුකර ව්‍යාපෘති තෝරා ගත යුතුය. |
| iii. | අංක RED/RES/29/2020 දරන අනුවර්තන පාලිත ස්මාර්ට් කාර්යාල/ ස්මාර්ට් ගොඩනැගිල්ල (Adaptive controlled smart office/smart building) හා අංක N/MD/RES/85/2017-1/2018 දරන | RED/RES/29/2020 දරන ව්‍යාපෘතිය භාර ඉංජිනේරු ආයතනය හැර යාම නිසා ඒ සඳහා සුදුසු ඉංජිනේරුවරයෙකු නොසිටි බැවින් මෙම ව්‍යාපෘති නවතා දමන ලදී. මෙම ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර | නිසි පරිදි ශක්‍යතා අධ්‍යනයක් සිදුකර ව්‍යාපෘති තෝරා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අධීක්‍ෂණය සහ ග්‍රහණය කර ගැනීම සඳහා තත්‍ය කාලීන ආරක්‍ෂිත රොබෝ යන්ත්‍රයක් සහ දෘඪ ජංගම දුරකථන – අදියර 02 (A security Robot for real time monitoring and capturing using android mobile - phase 02) යන ව්‍යාපෘති දෙකෙහි කණ්ඩායමේ නිලධාරීන් සේවයෙන් ඉවත් වීම හා ඉංජිනේරු කාර්යමණ්ඩල හිඟතාවය හේතුවෙන් අතරමඟ නවතා දමා ඇති අතර, ඇස්තමේන්තු පිරිවැය වූ රු.1,140,000 ඉක්මවා රු.1,345,345 ක මුදලක් අත්හැර දමන අවස්ථාව වන විට වියදම් කර තිබුණි. | පරීක්ෂා සඳහා මිලදී ගනු ලැබූ භාණ්ඩ ආයතනයේ කාර්යාලයක සවිකර භාවිතා කිරීමට කටයුතු කළ අතර මිලදී ගත් විදුලි සහ ඉලෙක්ට්‍රොනික උපකරණ අවශ්‍ය ව්‍යාපෘති වලට භාවිතා කිරීම සඳහා විදුලි හා විද්‍යුතත් දෙපාර්තමේන්තුවට භාර දෙන ලදී.<br>* N/MD/RES/85/2017-1/2018 මෙම ව්‍යාපෘතියේ පළමු අදියර නියමිත පරිදි අවසන් කල අතර පළමු අදියරේ දිගුවක් ලෙස දෙවන අදියර ආරම්භ විය. දෙවන අදියර අතර තුරදී පර්යේෂණ කටයුතු සිදු කල පර්යේෂණ ඉංජිනේරුවරයා රැකියාවෙන් ඉවත් වීම නිසා ඉහත කී තාක්ෂණයන් හා සැකසූ රොබෝ යන්ත්‍ර ආයතනය තුල ඉදිරියේදී සිදු කරනු ලබන අදාල පර්යේෂණයන් සඳහා භාවිතා කිරීමට හැකියාව පවතී. | |
| iv. | ඇස්තමේන්තු පිරිවැය රු.2,900,000ක් වූ අංක ENED/RES/41/2020-01 දරන ගොවිපල මට්ටමේ පළතුරු සහ එළවළු සඳහා එලදායී ශීත ගබඩා පද්ධතියක් අවම පිරිවැයක් මත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් 2020 නොවැම්බර් මාසයේ ආරම්භ කර රු.615,683 ක් වියදම් කිරීමෙන් පසු අක්‍රීය තත්ත්වයේ පැවතියදී එම ව්‍යාපෘතියේ ඉදිරි ක්‍රියාකාරීත්වය පිළිබඳ පරීක්ෂා කිරීමකින් තොරව 2022 පෙබරවාරි මාසයේ අංක ENED/RES/PD/35/2022 දරන එම අරමුණින්ම යුතු තවත් ව්‍යාපෘතියක් රු.4,000,000 ක ඇස්තමේන්තුවක් මත ආරම්භ කර රු.538,579 ක වියදම් දරා පරීක්ෂණ අවස්ථාව වන විට එම ව්‍යාපෘතියද අක්‍රියව පැවතුණි. | ජනාධිපති කාර්යාලයේ ඉල්ලීමක් මත නිපුණතා සංවර්ධන තෘතියික අධ්‍යාපන පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය හරහා ශීතාගාර පද්ධතියක් නිර්මාණය කරන ලෙස ඉල්ලීමක් කළ නිසා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ඇතිව ENED/RES/PD/35/2022 අංකය යටතේ ව්‍යාපෘතියේ මූලික කටයුතු ආරම්භ කරණ ලදී. ඒ අතරතුරදී ENED/RES/41/2020-01 ව්‍යාපෘතියේ විවිධ එළවළු කාණ්ඩ ක්ෂේත්‍ර පරීක්ෂණයට භාජනය කිරීමේදී තත්වය පිළිබඳ ගැටළුකාරී තත්වයක් ENED/RES/PD/35/2022 ව්‍යාපෘතිය අත්හිටුවන ලද අතර ඒ යටතේ මිළදී ගත් භාණ්ඩ පිළිබඳව විමර්ශනයක් සිදුකර එම භාණ්ඩ ENED/RES/41/2020-01 ව්‍යාපෘතිය යටතේ කරණු ලබන ඉදිරි වැඩිදියුණු කටයුතු වලට යොදා ගැනීමට තීරණය කරන ලදී. | නිසි පරිදි ශක්‍යතා අධ්‍යනයක් සිදුකර ව්‍යාපෘති තෝරා ගත යුතුය. |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී තොරතුරු තාක්ෂණ අංශයට රු.2,217,600 ක අගයකට “Hardware Fire wall watch Guard fire box 290” ඒකකයක් මිලදී ගෙන තිබුණි. ආයතනයේ සාමාන්‍ය මාසික අවශ්‍යතාවය 40Mbps ක් ලෙස දක්වා තිබූ අතර, ඉහත සපයාගෙන තිබූ Fire wall උපකරණයේ මාසික ධාරිතාවය 5.5 Gbps (5500 Mbps) විය. ඒ අනුව මිලදී ගෙන තිබූ උපකරණය මාසික අවශ්‍යතාවයට වඩා 5460Mbps ක් ප්‍රමාණයකින් වැඩි ධාරිතාවයෙන් යුත් උපකරණයකි. සැපයුම්කාර ආයතනය විසින්ම සපයා තිබූ මේ හා සමාන මීට පෙර භාවිතා කල උපකරණය භාවිතා කිරීමට හැකිව තිබුනේ 2016 – 2022 කාල පරිච්ඡේදය තුළදී පමණක් වූ අතර 2022 වර්ෂයේදී සපයා තිබූ නව fire wall පද්ධතිය නිෂ්පාදනය කර ඇත්තේ 2021 වර්ෂයේ බැවින් මෙම පද්ධතියද 2029 වර්ෂය තුළ හෝ ඊට ආසන්න කාලයකදී ඉවත් කිරීමට සිදු විය හැකි හෙයින්, ඉදිරි වසර 06 ක කාලච්ඡේදයක් තුළ මෙම Network පද්ධතියේ භාවිතය 5460Mbps ප්‍රමාණයකින් වැඩි වීමක් අපේක්ෂා කළ නොහැකි බැවින් ඉහත පරිදි අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා ධාරිතාවයෙන් යුත් උපකරණ සඳහා අනවශ්‍ය මුදලක් වැයකර ඇති බව නිරීක්ෂණය විය. | Firewall තෝරා ගැනීමේදී අවසරලත් පරිශීලකයින් සංඛ්‍යාව (authenticated Users) වැදගත් වේ. එවකට අප ආයතනයේ 300 කට ආසන්න සේවක සංඛ්‍යාවක් සේවය කල අතර ඉදිරි වසර වලදී නව බඳවාගැනීම් සමඟ එය තවත් වැඩිවන නිසා එය සැලකිල්ලට ගෙන පරිශීලකයින් සංඛ්‍යාව 500ක් ලෙස ඉල්ලුම් කර ඇත. මෙරට විකිණීමට ඇති firewall වර්ග කිරීමේදී පරිශීලක සංඛ්‍යාව අනුව වෙනස් වේ. එය 1-200, 200-500, 500-2500, 2500 ~ වන ආකාරයට වෙනස්වේ. මෙයට අනුකූලව firewall එකෙහි උපරිම ධාරිතාවද (throughput) වෙනස් වේ. එමෙන්ම මෙහි ඇති සුරක්ෂිත ලක්ෂණ (security features) අනුවද ධාරිතාව වෙනස්වේ.<br>අප ආයතනය සේවක සංඛ්‍යාවට සාපේක්ෂව ඉතා අඩු වේග අන්තර්ජාල සම්බන්ධතාවක් ලබාගෙන තිබුනද අවශ්‍ය පරිශීලක සංඛ්‍යාවට සපුරා ගැනීම මෙන්ම අවශ්‍ය සුරක්ෂිත ලක්ෂණයන් වල අවම මට්ටම සපුරා ගැනීම සඳහා ඉදිරිපත් කල පිරිවිතර අනුව ඉදිරිපත් වූ ලංසු අනුව අවම හරවත් ලංසුව තෝරා මිලදී ගැනීම කර ඇත. මෙම උපකරණය සඳහා වන බලපත්‍රය ඉදිරි වසර 6කින් (2029) ඉවත් කරන බවට එම නිෂ්පාදන ආයතනය දන්වා නොමැත. | ආයතනයේ අවශ්‍යතාවය නිෂ්චිතව හදුනාගෙන අවශ්‍ය ධාරිතාවයෙන් යුතු උපකරණ මිලදී ගත යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයේ නඟාසිටුවීම වෙනුවෙන් තවදුරටත් තාක්ෂණ ඉන්කියුබේටර් අංශයේ සේවාවන් සැපයීමේ අවශ්‍යතාවය රට තුළ විශාල ලෙස පැවතියදී අත්පත් කරගෙන තිබූ වටිනාකම රු.103,423,406ක ඉතා ඉහළ ධාරිතාවයෙන් යුතු අධිතාක්ෂණික යන්ත්‍රෝපකරණ 14 ක්, ස්ථාවර වත්කම් ලේඛණයේ ඇතුලත් කර නොතිබූ රු.13,250,000 ක වටිනාකමකින් යුත් යන්ත්‍රයක් සහ වටිනාකම හඳුනා නොගත් තවත් යන්ත්‍රයක් අක්‍රීයව හෝ ඌණ උපයෝජිතව පැවතුණි. | තාක්ෂණ ඉන්කුබේටර් අංශය 2018 වසරේදී පිහිටුවනු ලැබුවේ අප රට තුළ නව නිපැයුම්කරුවන්ට උපකාර කිරීම පිණිසය. ඒ අනුව නව නිපැයුම්කරුවන්ගේ කොමිෂම හා එක්ව එම සේවාවන් සමග එක්ව නව නිපැයුම්කරුවන්ට අවශ්‍ය සේවාවන් සැපයීමට 2018 සිට කටයුතු කරණ ලදී. අදාල යන්ත්‍ර සූත්‍ර අවශ්‍යතා අනුව ප්‍රයෝජනයට ගෙන තිබුණි. | ආයතනයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගත හැකි ලෙස යන්ත්‍ර උපකරණ කාර්යක්ෂමව උපයෝජනය කල යුතුය. |